# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# ප්‍රසම්පාදන දැන්වීමයි

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ප්‍රසම්පාදනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවෙන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වසර දෙකක කාලයක් සඳහා කුලී / බදු පදනම මත "**UGC සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ප්‍රසම්පාදනය**" සඳහා 2025 පෙබරවාරි 19 වන දින ප.ව. 3.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. ගොඩනැගිලි හිමිකරුවන් හෝ නෛතිකව බලයලත් පුද්ගලයන් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.

ගොඩනැගිල්ල පහත සඳහන් අවශ්‍යතා සහ පහසුකම් සහිත එකක් වි යුතුය.

- අවශ්‍ය ගොඩනැගිල්ල, කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 20, UGC ලේකම් කාර්යාලයේ සිට කි.මී. 5 ක් ඇතුළත පිහිටා තිබිය යුතුය.
- බිම් ප්‍රමාණය දළ වශයෙන් වර්ග අඩි 7,000 ක් විය යුතුය.
- ස්ත්‍රී හා පුරුෂ වශයෙන් වෙන් වෙන්ව ප්‍රමාණවත් වැසිකිළි පහසුකම්.
- UGC අවශ්‍යතාවය අනුව කාර්යාලයකට සුදුසු පරිදි දැනට පවතින සැකැස්ම ප්‍රතිසංස්කරණය කිරීමට / නැවත සකස් කිරීමට UGC වෙත අවසර දීමට හිමිකරු එකඟ විය යුතුය.
- ප්‍රසිද්ධ මාර්ග ඔස්සේ පහසුවෙන් ළඟා විය හැකි විය යුතුය.
- ගොඩනැගිලි පරිශ්‍රය තුළ අවම වශයෙන් වාහන 4ක් නවතා තැබිය හැකි ප්‍රමාණවත් රථ ගාලක් තිබිය යුතුය.
- ගොඩනැගිල්ල සඳහා වෙනම තෙකලා විදුලි සැපයුමක් තිබිය යුතුය.
- ගොඩනැගිල්ල සඳහා වෙනම දුරකථන සම්බන්ධතාව / සම්බන්ධතා තිබිය යුතුය.
- මහල් දෙකකට වඩා වැඩි නම් විදුලි සෝපාන පහසුකම් තිබිය යුතුය.
- වෙනම නළ ජලය මතා සනීපාරක්ෂක පහසුකම් සහ මලාපවහන පද්ධතියක් සහිත හොඳින් ආරක්ෂිත ප්‍රදේශයක පිහිටි ගොඩනැගිල්ලක් විය යුතුය.

ගොඩනැගිල්ලෙහි ප්‍රමාණය, අපේක්ෂිත මාසික කුලිය / බද්ද, නියමයන් සහ කොන්දේසි, පවතින පහසුකම්, පරිශ්‍රය වෙත පැමිණීම සඳහා සම්බන්ධතා තොරතුරු, හිමිකාරීත්වය තහවුරු කිරීම (ඔප්පුවෙහි පිටපතක්) දක්වමින් ලංසු ඉදිරිපත් කළ යුතුය. (නිර්දේශිත ආකෘතියෙහි පමණි). ආපසු ගෙවනු නොලබන ගාස්තුව රු. 3,500/- (රුපියල් තුන්දහස් පන්සියය) ගෙවීමෙන් ලබාගත් තිල ලදුපත ඉදිරිපත් කිරීමෙන් 2025 ජනවාරි 30 වන දින සිට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / සාමාන්‍ය පරිපාලන වෙතින් ලංසු ලිපි ලේඛන ලබාගත හැක. ගෙවීම් මුදලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සරප් වෙත කළ යුතුය.

මුද්‍රා තබන ලද ලංසු, ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ප්‍රසම්පාදනය" යන්න සඳහන් කර, 2025 පෙබරවාරි 19 වන දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07, ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 20, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / සාමාන්‍ය පරිපාලන කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලීම සිදු කළ යුතුය.

ලද ලංසු, ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ප.ව. 3.00 ට, කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 20, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ, නව අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී විවෘත කරනු ලැබේ.

ලංසු කැසීමේ දී හෝ ඉදිරිපත් කිරීමේදී ලංසුකරුවන් හට දැරීමට සිදුවන ඕනෑම පිරිවැයක් හෝ වියදමක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කිසිදු වගකීමක් නොදරයි.

වැඩිදුර තොරතුරු සඳහා දුරකථන අංක 011-2685183 හරහා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / සාමාන්‍ය පරිපාලන අමතන්න.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,**
**අංක 20, වෝඩ් පෙදෙස,**